# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2324/45 - 2023 මාර්තු මස 24 වැනි සිකුරාදා - 2023.03.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උප වගන්තිය සහ 14 වන වගන්තිය සමග කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 මාර්තු මස 23 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි **"2023 අංක 06 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි"** ලෙස හඳුන්වනු ලැබේ.

2. මෙම රෙගුලාසි 2023 මාර්තු මස 24 වැනි දින සිට බලාත්මක වේ.

3. 2019 ජනවාරි මස 25 දිනැති අංක 2107/45 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරන ලද 2019 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි, මෙමගින් සංශෝධනය කෙරේ.

4. ඉහත සඳහන් කර ඇති 2019 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල අංක 3 (ආ) සහ 3 (ඇ) රෙගුලාසීන් මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් නව රෙගුලාසිය රෙගුලාසි අංක 3 (ආ) ලෙස ඇතුළත් කර පහත පරිදි කියවිය යුතුය.

"3 (ආ) 2022 නොවැම්බර් මස 01 දිනැති අංක 22/1653/617/013 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කර්මාන්ත අමාත්‍යාංශයේ අනුමැතියලත් ඕනෑම නිෂ්පාදකයෙකු / එකලස් කරන්නෙකු විසින්, නිෂ්පාදන අගයෙන් 50% කට වැඩි දේශීයව එකතුකළ අගයකික් යුතුව (ලාභ ආන්තිකයකින් තොරව) ශ්‍රී ලංකා රේගුවේ නිෂ්පාදන බන්ධිත (In Bond) පහසුකම තුළ දේශීයව නිෂ්පාදනය / එකලස් කරනු ලැබූ, සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 8703.21.63 සහ 8703.21.72 යටතේ වර්ගීකරණය කරන ලද සිව් රෝද රථ, 2026 දෙසැම්බර් මස 31 දිනට පෙර, දේශීයව භාවිතය සඳහා බන්ධිතයෙන් ඉවත් කිරීමේ රේගු ප්‍රකාශය (Ex -Bond CUSDEC) ඉදිරිපත් කිරීමෙන් ශ්‍රී ලංකා රේගුවෙන් නිෂ්කාශනය කිරීමේදී ප්‍රති අගුළු තිරිංග පද්ධති තාක්ෂණය (ABS Technology) අදාළ නොවේ."

1A - PG 6273 — 376 (2023/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

5. 2023 ජනවාරි 01 දිනැති අංක 2312/75 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද ආදායම් ආරක්ෂණ නියෝග මගින්, සංයෝජිත වර්ගීකරණ සංකේතවලට සිදු කරන ලද වෙනස්කම් (සංයෝජිත වර්ගීකරණ සංකේත - 2022 සංස්කරණය) ප්‍රකාරව ඉහත සඳහන් කර ඇති 2019 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල **II වන උපලේඛනයේ** IV තීරුවෙහි 3 (i), (ii) සහ (iii) හි නිශ්චිතව දක්වා ඇති සංයෝජිත වර්ගීකරණ සංකේත ආදේශ කර පහත පරිදි කියවිය යුතුය.

**II වන උපලේඛනය : ආරක්ෂණ මිනුම් /ප්‍රමිති**

| *I* | *II* | *III* | | | *IV* |
|---|---|---|---|---|---|
| *අංකය* | *සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය* | *ආරක්ෂණ මිනුම් / ප්‍රමිති* | | | *ආරක්ෂණ මිනුම් / ප්‍රමිතිවලට යටත් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක* |
| | | *වායු බැලුන* | *ආසන පටි* | *ප්‍රති අගුළු තිරිංග පද්ධතිය* | |
| 03 (i) | | C | C | C | 8704.21.71, 8704.21.72, 8704.21.91, 8704.21.92, 8704.21.93, 8704.21.99<br>8704.31.71, 8704.31.72, 8704.31.91, 8704.31.92, 8704.31.93, 8704.31.99<br>8704.41.71, 8704.41.72, 8704.41.91, 8704.41.92, 8704.41.93, 8704.41.99<br>8704.51.71, 8704.51.72, 8704.51.91, 8704.51.92, 8704.51.93, 8704.51.99 |
| 03 (ii) | 87.04 | - | C | C | පහත දැක්වෙන සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සහ 3 (i), 3 (iii) හි IV වන තීරුවේ දැක්වෙන සංයෝජිත වර්ගීකරණ සංකේතාංක <u>හැර</u> සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ 87.04 යටතේ වර්ගීකරණය කරන ලද සංයෝජිත වර්ගීකරණ සංකේතාංක<br>8704.21.21, 8704.21.22, 8704.31.21, 8704.31.22, 8704.31.23, 8704.41.21, 8704.41.22, 8704.51.21, 8704.51.22, 8704.51.23, 8704.60.10, 8704.60.20 |
| 03 (iii) | | - | C | C | 8704.21.41, 8704.21.42, 8704.21.43, 8704.21.44, 8704.21.61, 8704.21.62, 8704.21.63, 8704.21.64, 8704.21.65, 8704.21.66, 8704.21.67, 8704.21.68<br>8704.31.41, 8704.31.42, 8704.31.43, 8704.31.44, 8704.31.61, 8704.31.62, 8704.31.63, 8704.31.64, 8704.31.65, 8704.31.66, 8704.31.67, 8704.31.68<br>8704.41.41, 8704.41.42, 8704.41.43, 8704.41.44, 8704.41.61, 8704.41.62, 8704.41.63, 8704.41.64, 8704.41.65, 8704.41.66, 8704.41.67, 8704.41.68<br>8704.51.41, 8704.51.42, 8704.51.43, 8704.51.44, 8704.51.61, 8704.51.62, 8704.51.63, 8704.51.64, 8704.51.65, 8704.51.66, 8704.51.67, 8704.51.68 |

(C - සියලුම ආරක්ෂණ මිනුම්/ප්‍රමිතිවලට අනුකූල වියයුතු)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.